**වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය**

# ඇල්කඩුව වැවිලි සමාගම

# ඇබෑර්තු

ඇල්කඩුව වැවිලි සමාගමේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තනතුර : වතු අධිකාරි - 01 (ස්ථිර)

- **සුදුසුකම් - බාහිර අයදුම්කරුවන්**

  විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්ම පිළිබඳ ප්‍රථම උපාධිය සමග වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ තේ, පොල්, රබර් හෝ අනෙකුත් මිශ්‍ර භෝග වැවිලි පිළිබඳ වසර 03 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

  වැවිලි කළමනාකරණ පිළිබඳ ඩිප්ලෝමා සහතිකය, කෘෂිකර්ම පිළිබඳ ඩිප්ලෝමාවක් සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ ඉහළ දැනුමක් තිබීම අතිරේක සුදුසුකම් වේ.

- **සුදුසුකම් - අභ්‍යන්තර අයදුම්කරුවන්**

  ඇල්කඩුව වැවිලි සමාගමේ, කනිෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ , 1 ශ්‍රේණියේ සහකාර වතු අධිකාරි තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවය.

**වැටුප් පරිමාණය** : MM 1-1 - කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක : No 01/2025
වැටුප රු. 91,690 – 2,480 X 10 – 3,450 X 15 – Rs. 168,240/-

**මූලික වැටුප් පියවර** : 01.01.2026 රු. 81,710.00 + (මෙම තනතුර සඳහා අනුමත කරන ලද අනෙකුත් දීමනා) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන II ප්‍රකාරව.

**වයස** : වයස අවුරුදු 25 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

## තනතුර : සහකාර වතුඅධිකාරීවරු - 04 (ස්ථිර)

- **සුදුසුකම් - බාහිර අයදුම්කරුවන්**

  විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් කෘෂිකර්ම ප්‍රථම උපාධිය සහ තේ, රබර්, පොල් සහ මිශ්‍ර භෝග වැවිලි ක්ෂේත්‍රයේ අධීක්ෂණ ධාරිතාවයෙන් වසර 01 ක පළපුරුද්ද.

- **සුදුසුකම් - අභ්‍යන්තර අයදුම්කරුවන්**

  තේ, රබර්, පොල් සහ අනෙකුත් මිශ්‍රභෝග වැවිලි ක්ෂේත්‍රයේ 1 ශ්‍රේණිය කළමනාකරණ සහකාර කාණ්ඩයේ තනතුරක අවමඅවුරුදු 05 ක පළපුරුද්ද.

**වැටුප් පරිමාණය** : JM 1-1 - කළමනාකරණ සේවා චක්‍රලේඛ
අංක : No. 01/2025
වැටුප රු. 72,650 – 1,360 X 10 – 2,040 X 18 –
Rs. 122,970/-

**මූලික වැටුප් පියවර** : 01.01.2026 රු. 65,633 + (මෙම තනතුර සඳහා රජයේ අනුමත කරන ලද දීමනා) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන II ප්‍රකාරව.

**වයස** : වයස අවුරුදු 25 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රම වේදය** : පත්කිරීමේ බලධාරීන් විසින්පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහමය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සිදු කෙරේ.

**ව්‍යුහමය සම්මුඛ පරීක්ෂණය :**

| | |
|---|---|
| ● අදාළ අමතර පළපුරුද්ද | ලකුණු 30 |
| ● අදාළ අමතර සුදුසුකම් | ලකුණු 30 |
| ● වෙනත් ලද ජයග්‍රහණ | ලකුණු 15 |
| ● සම්මුඛ පරීක්ෂණයේදී ලබන කාර්ය සාධණය | ලකුණු 25 |
| ලකුණු | 100 |

**වෙනත්** - මෙම තනතුරුවලට සිදු කරනු ලබන සියලුම පත්කිරීම් අදාළ බඳවාගැනීමේ ක්‍රමවේදයේ විධිවිධානවලට අනුගතව සිදුකෙරේ.

- සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

**අයදුම්පත්** - අයදුම්කරුවන් විසින්, සියලුම විස්තර හා උප්පැන්න, අධ්‍යාපන සහතික වල හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සහිතව සකස් කළ අයදුම්පත්, පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම්ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අදාළ භාරගැනීම අවසන් කරනු ලබන වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනය 2026 මැයි 25 වන දිනට පෙර පහත සඳහන් ලිපිනය වෙත එවිය යුතුය.

**සභාපති,**
**ඇල්කඩුව වැවිලි සමාගම,**
**රත්වත්ත, උකුවෙල.**
**066-2242518**
**05.05.2026**